# සාමාන්‍ය සමයේ විසිදෙවන සතිය
# සඳුදා

## පළමුවන දේව ප්‍රකාශනය

ශුද්ධවූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටාගත් කොටසකි.

1 තෙසලෝනික 4: 13–18

"ක්‍රිස්තුස් වහන්සේ අදහමින් පරලෝ සැපත් වූ අය පළමුකොට නැඟිට්න්නෝ ය."

සහෝදරවරුනි, මතු බලාපොරොත්තුවක් නැති සෙසු අය මෙන් ඔබ ශෝක නොවන පිණිස, මියගියවුන් ගැන ඔබ නොදැන සිටීම කිසිසේත් අපගේ කැමැත්ත නොවේ. ජේසුස් වහන්සේ නැසී නැවත උත්ථාන වූ සේකැ යි අපි අදහමු. එසේ ම ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාස කරමින් පරලෝ සැපත් වූ අය උන් වහන්සේ මගින් දෙවියන් වහන්සේ නැවත ගෙනෙන සේකැ යි ද අදහමු.

අප දැන් ඔබට කියන්නේ ස්වාමින් වහන්සේ ම වදාළ කරුණකි. එනම් ස්වාමින් වහන්සේගේ ආගමනයේ දී ජීවත් ව සිටින අපට, පරලෝ සැපත් වූ අයට නොමැති විශේෂ වාසියක් නැති බව ය. මන්ද, ස්වාමින් වහන්සේ ම අණ දීමේ ශබ්දය ද, අග්‍ර දේව දූතයෙකුගේ හඬ ද, දෙවියන් වහන්සේගේ හොරණෑ නාදය ද ඇතිව ස්වර්ගයෙහි බැස වදාරණ සේක. ක්‍රිස්තුස් වහන්සේ අදහමින් පරලෝ සැපත් වූ අය පළමුකොට නැඟිට්න්නෝ ය. එවිට ජීවතුන් අතර සිටින අපි, වලාකුළුවලින් අහසට ඔසවාගනු ලබන්නෙමු. මෙසේ අපි නිතරම ස්වාමින් වහන්සේ සමඟ සිටින්නෙමු. එහෙයින් මේ වචනවලින් එකිනෙකා සනසන්න.

දේව වචනය මෙසේ ය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 96: 1, 3-5, 11-13

පිළිතුර: සමිඳාණෝ මිහිතලය පාලනය කරන සේක.

ගීය:

සමිඳුන් හට නව ගීයක් ගයන්න. පොළෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ගී ගයන්න. විජාතීන් අතර එතුමන්ගේ මහිමය ප්‍රකාශ කරන්න. ජනතාවන් අතර එතුමන්ගේ ප්‍රබල ක්‍රියා පවසන්න.

සමිඳාණෝ උතුම් ය. අතිශයින් පැසසිය යුතුය. සියලු දෙවිවරුන්ට වඩා එතුමන්ට ගරු බිය පෑ යුතු ය. ජනතාවගේ සියලු දෙවිවරු පිළිම පමණකි. සමිඳාණෝ ම දෙව් ලොව මැවූ සේක.

සගලොව ප්‍රීති ප්‍රමෝද වේවා! නරලොව තුටු පහටු වේවා!

සමුදුරත් එහි ඇති සියල්ලත් ගිගුරුම් දේවා!

කෙත්වතු සහ එහි ඇති සියල්ලත් ප්‍රීතිමත් වේවා! එවිට වන රොදෙහි ගස් කොළන් ප්‍රීති නාද දෙන්නේ ය.

සමිඳාණන් මිහිතලය පාලනය කිරීමට වඩින විට ඒවා නද දෙන්නේය.
එතුමාණෝ ලෝ වැසියන් සාධාරණ ලෙස ද අවංක ලෙස ද පාලනය කරන සේක.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
"ලෝකයේ ආලෝකය මම ය.
මා අනුගාමී වන්නා ජීවනයේ ආලෝකය ලබන්නේ ය"යි සමිඳාණෝ වදාරණ සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"දිළිඳුන් හට සුබාරංචිය ප්‍රකාශ කිරීමට ද වහලුන්ට මිදීම ලබා දීමට ද ස්වාමින් වහන්සේ මා එවා වදාළ සේක."
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ලූක් 4: 16-30

"දිළිඳුන්ට සුබාරංචිය දේශනා කරනු වස් ස්වාමින් වහන්සේ මා එවා වදාළ සේක."

ජේසුස් ස්වාමින් වහන්සේ තමන් ඇති දැඩි වූ නාසරෙත් නුවරට පැමිණ සිරිත් පරිදි සබත් දවසේ දී ධර්ම ශාලාවට වැඩම කර කියවීම පිණිස නැගිට සිටි සේක. එවිට දිවැසිවර ඉසයියස්ගේ ග්‍රන්ථය උන්වහන්සේට දෙන ලද්දේ ය. උන්වහන්සේ ග්‍රන්ථය දිග හැර, මෙසේ ලියා ඇති තැන සොයාගත් සේක.

“ස්වාමීන් වහන්සේගේ ආත්මය මා කෙරෙහි ඇත. මක්නිසා ද දිළිඳුන් හට සුබාරංචිය දේශනා කරනු වස් උන්වහන්සේ මා ආලේප කළ සේක. වහලුන්ට මිදීම ද අන්ධයන්ට පෙනීම ද ලැබෙන බව දන්වන්නටත් පීඩිතවූවන් මුදන්නටත්, ස්වාමීන් වහන්සේගේ ප්‍රසාදය ලත් වසර ප්‍රකාශ කරන්නටත් මා එවා වදාළ සේක.”

උන්වහන්සේ එය කියවා, ග්‍රන්ථය අකුළා, උපස්ථායක තැනට දී වැඩහුන් සේක. එවිට ධර්ම ශාලාවෙහි සිටි සියල්ලෝ උන්වහන්සේ කෙරෙහි නෙත් යොමා සිටියහ. උන්වහන්සේ ඔවුන්ට කතා කරන්නට පටන් ගෙන “අද ඔබ සවන් දී සිටියදී මේ ශුද්ධ ලියවිලි පාඨය ඉෂ්ට වී ය”යි වදාළ සේක. සියල්ලෝම උන්වහන්සේට ප්‍රශංසා කරමින් උන්වහන්සේගේ මුවින් පහළ වූ කාරුණික වචන ගැන පුදුම ව, “මේ ජෝසෙප්ගේ පුතා නොවේ දැ”යි කීහ. එවිට උන්වහන්සේ කතා කොට ‘වෙද තුමාණනි, ඔබ ඔබම සුව කරගන්න’ යන ප්‍රස්ථා පිරුළ ඔබ නිසැකවම මට ගෙන හැර පා, ‘කපර්නාවුමෙහි දී ඔබ විසින් කරන ලදැයි අප ඇසූ ක්‍රියා ඔබේ උපන් ගම වන මෙහිදීත් කරන්නැ’යි මට කියනු ඇත. සැබැවින්ම මම ඔබට කියමි. ගමේ දිවැසිවරයා ගමට අගේ නැත. සහතික ලෙස මම ඔබට කියමි. එලියාගේ කාලයේදී තුන් අවුරුදු සමසක් මුළුල්ලෙහි අහස පියවී, රට පුරා දැඩි සාගතයක් පැවති අතර, ඉශ්‍රායෙල් රටේ බොහෝ වැන්දඹුවන් සිටි නමුත්, සීදොන් පලාතෙහි ශාරප්තාවේ වැන්දඹු වෙත මිස අන් කිසිවෙකු වෙත එලියා නොයවන ලද්දේය. දිවැසිවර එලිෂාගේ කාලයේදී ඉශ්‍රායෙල් රටේ බොහෝ කුෂ්ඨ රෝගීන් සිටි නමුත්, සිරියානු ජාතික නාමන් මිස අන් කිසිවෙක් සුවය නොලැබී ය”යි වදාළ සේක. ධර්ම ශාලාවෙහි සිටි මුළු සමූහයා ඒ අසා කෝපාවිෂ්ඨ වූහ. ඔව්හු වහා නැගිට උන්වහන්සේ නුවරින් පිටතට නෙරපා, ප්‍රපාතයට හෙළනු වස් ඔවුන්ගේ නුවර ගොඩනඟා තිබුණු සීනයි කන්ද අද්දරට ගෙන ගියහ. එහෙත් උන්වහන්සේ ජනකාය මැදින් ගමන් කර නික්ම ගිය සේක.

සමිඳාණන් වහන්ගේ සුභාරංචිය මෙසේ ය.